ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

# පළමුවන ශ්‍රේණියට ඇතුළත් වන දරුවන් හඳුනා ගැනීම

## (ප්‍රාථමික පාසලට ප්‍රීතිමත් ආරම්භයක්)



**මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**

**වෙබ් අඩවිය : www.nie.ac.lk    විද්‍යුත් තැපෑල : info@nie.lk**

# පළමුවන ශ්‍රේණියට ඇතුළත් වන
# දරුවන් හඳුනා ගැනීම
**(ප්‍රාථමික පාසලට ප්‍රීතිමත් ආරම්භයක්...)**

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk විද්‍යුත් තැපැල : info @ nie.lk

**පළමුවන ශ්‍රේණියට ඇතුළත් වන**
**දරුවන් හඳුනා ගැනීම**
**(ප්‍රාථමික පාසලට ප්‍රීතිමත් ආරම්භයක්...)**

ප්‍රථම මුද්‍රණය - 2025

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN .................

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info @ nie.lk

මුද්‍රණය :

## සම්පත් දායකත්වය (2025)

**උපදේශනය**

මහාචාර්ය, මංජුලා විතානපතිරණ මහත්මිය
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

ආචාර්ය, දර්ශන සමරවීර මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

**අධ්‍යක්ෂණය**

ආර්. එම්. කේ. ද සිල්වා මිය, අධ්‍යක්ෂ,
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**සංස්කරණය හා සම්බන්ධීකරණය**

සජීවා රුවනි රඹුක්වැල්ල මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**තාක්ෂණික කමිටුව**

කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මහතා, විශ්‍රාමික අධ්‍යක්ෂ,
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

ඩී. එම්. ඩබ්. මුණසිංහ මහත්මිය, විශ්‍රාමික මහාචාර්ය,
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

**විෂයමාලා කමිටුව**

සජීවා රුවනි රඹුක්වැල්ල මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

එස්. එම්. සඳමාලි දේශප්‍රිය මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

ජේ. ඒ. නිර්මලා දමයන්ති ජයසිංහ මෙනවිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

එච්. ජී. වනසේකර මිය, කථිකාචාර්ය

කේ. ආර්. එම්. එස්. රණසිංහ මිය, කථිකාචාර්ය

එම්. එස්. එස්. ප්‍රනාන්දු මිය, සහකාර කථිකාචාර්ය

කේ. ඩී. එන්. කලුබෝවිල මිය, සහකාර කථිකාචාර්ය

කේ. මහේන්ද්‍රන් මයා, සහකාර කථිකාචාර්ය

**භාෂා සංස්කරණය**

ඩබ්ලිව් කරුණාරත්න, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය, ගිරාගම

## සම්පත් දායකත්වය (2016)

**උපදෙස් සැපයීම සහ මග පෙන්වීම**

**සුනිල් හෙට්ටි ආරච්චි මැතිතුමා, ලේකම්,**
අධ්‍යාපන අමාත්‍යාංශය

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර මහත්මිය**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

**එස්. යූ විජේරත්න මහතා, අතිරේක ලේකම්**
(ප්‍රතිපත්ති සැලසුම් හා කාර්යසාධන සමාලෝචන)

**ආචාර්ය, පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

**උපදේශනය**

**මහාචාර්ය ජී. ඩී. ලේකම්ගේ මහත්මිය**
අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

**තාක්ෂණික කමිටුව**

**ආචාර්ය එල්. සී. කොතලාවල මහත්මිය**
විශ්‍රාමික මහාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

**ආචාර්ය චන්ද්‍රා ගුණවර්ධන මහත්මිය,**
විශ්‍රාමික සම්මාන මහාචාර්ය,
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

**වෛද්‍ය නීල් තලගල මහතා**
ප්‍රජා වෛද්‍ය උපදේශක, පවුල් සෞඛ්‍ය කාර්යංශය

**වෛද්‍ය සමන්මලී සුමනසේන මහත්මිය,**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, රාගම

**කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මහතා, විශ්‍රාමික අධ්‍යක්ෂ,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

**ආචාර්ය අනෝමා ආරියරත්න මහත්මිය, ප්‍රධානී,**
මුල්ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙර්තමේන්තුව, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

**ඩී. එම්. ඩබ්. මුණසිංහ මහත්මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

**ආචාර්ය කේ. ඒ. සී. අල්විස් මහත්මිය,**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,**
අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

**බී. පී. විතානගේ මහත්මිය,**
අධ්‍යක්ෂ, සැමට අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය

**පී. එම්. ඒ. එස්. පණ්ඩිතසේකර මහත්මිය**
අධ්‍යක්ෂ, ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය

**සම්පත් පුද්ගල දායකත්වය**

**එම්. ඒ. ජී. ඩබ්. කුලරත්න මයා, අධ්‍යක්ෂ,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**ඩබ්. ජී. එස්. කුමාර මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**සුරනිමල ලේකම්ගේ මයා, විශ්‍රාමික අධ්‍යක්ෂ,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**එස්. ලලිතාම්බිගෛ මහත්මිය,**
**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,**
ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

**ඒ. ඩී. ලියනගේ මයා, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,**
සැමට අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

**ආර්. එම්. පී. ඩී. රත්නායක මිය,**
**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,**
සැමට අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

**ඩබ්. ලලිතා මිය, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,**
කලාප අධ්‍යාපන කාර්යාලය, හොරණ.

**චන්දන බණ්ඩාර සමරකෝන් මයා, චිත්‍ර කලා ආචාර්ය**
ක්‍රියාකාරකම් සංස්කරණය :

**ආර්. එම්. කේ. ද සිල්වා මිය, අධ්‍යක්ෂ,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**වී. එන්. එස්. උදයසන්තිරන් මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**ඩබ්ලිව්. ජී. එස්. කුමාර මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**එස්. ආර්. රඹුක්වැල්ල මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**එස්. එම්. සඳමාලි දේශප්‍රිය මිය, කථිකාචාර්ය,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**ටී. සී. පීරිස් මිය, කථිකාචාර්ය,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**ජේ. ඒ. නිර්මලා දමයන්ති ජයසිංහ මෙනවිය, කථිකාචාර්ය,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**එච්. ජී. වනසේකර මිය, සහකාර කථිකාචාර්ය,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**කේ. ආර්. එම්. එස්. රණසිංහ මිය, සහකාර කථිකාචාර්ය,**
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

# පළමුවන ශ්‍රේණියට ඇතුළත් වන දරුවන් හඳුනා ගැනීම

## 1. හැඳින්වීම

1988 දී මහාචාර්ය ජෝශප් නාගි මහතාගේ මූලිකත්වයෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහයෝගය සහිත ව ප්‍රාථමික පාසලට පිවිසෙන දරුවන්ගේ ප්‍රවේශ නිපුණතා පිළිබඳ පර්යේෂණයක් සිදු කරන ලදී. එහි අනාවරණ අනුව 1998 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණයවලදී දරුවා හඳුනා ගැනීම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. 2007 සහ 2016 විෂයමාලා සංස්කරණවලදී මෙම වැඩසටහන යම් යම් සංශෝධන සහිත ව ඉදිරිපත් විය. 2025 වර්ෂයේ දී පළමුවන ශ්‍රේණියට පිවිසෙන දරුවන් සමග සිදු කරන ලද අත්හදා බැලීම්වල ප්‍රතිඵලයක් ලෙස සහ පළමුවන ශ්‍රේණියේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නියුතු ගුරුවරුන්ගේ අදහස් හා යෝජනා පදනම් කර ගනිමින් යාවත්කාලීන වූ සංශෝධිත වැඩසටහන මෙසේ ඉදිරිපත් කෙරේ.

මෙම වැඩසටහන පාසල්වලට හඳුන්වා දීමේ මූලික අරමුණු වන්නේ නිවසේ/පෙර පාසලේ සිට පාසලට පැමිණෙන දරුවන්ට වඩාත් ප්‍රීතිමත්, සුමට සංක්‍රාන්ති කාල පරිච්ඡේදයක් අත්පත් කර දීම ය. එසේම මෙම ක්‍රියාවලිය මගින් අලුතින් පළමුවන ශ්‍රේණියට ඇතුළත් වන සිසුන් තුළ පවත්නා හැකියාවන් හා තවදුරටත් සංවර්ධනය විය යුතු තත්ත්වයන් හඳුනා ගැනීමටත් ගුරුවරුන් සඳහා අවස්ථා සැලසේ. එමගින් පන්ති කාමරය තුළ සිදුවන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම හා සිසුන්ට වඩාත් ප්‍රියජනක ඉගෙනුම් වාතාවරණයක් ගොඩනැගීම ද අපේක්ෂා කෙරේ.

මෙම වැඩසටහන මගින් අනාවරණය කර ගන්නා ලද සිසුන්ගේ කුසලතා අනුව සිසුන් එකිනෙකා සමග සංසන්දනාත්මක ව සලකා බැලීම නොකළ යුතු ය. එසේ ම අනාවරණය කර ගන්නා තොරතුරු ප්‍රසිද්ධ කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම ද නොකළ යුතු ය. මෙම ක්‍රියාවලියේ අනාවරණ, පළමුවැනි ශ්‍රේණියේ එදිනෙදා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සමග සම්බන්ධ කර ගැනීම ද එය සිසුන්ගේ සමස්ත සංවර්ධනය ඉලක්ක කරගත් ක්‍රියාවලියකට යොදා ගැනීම ද ගුරුවරයාගේ වගකීම ය.

## 2. පාසලට ඇතුළත්වන දරුවන් හඳුනා ගැනීමේ වැදගත්කම

විධිමත් පාසල් අධ්‍යාපනයට පිවිසීම දරුවන්ගේ ජීවිතයේ එක් වැදගත් සිදුවීමකි. එතෙක් ඔවුන්ට සමීප ව සිටි වැඩිහිටියන්, ගුරුවරුන් හෝ යහළුවන් පාසලෙහි නැත. නුහුරු නුපුරුදු පාසල් පරිසරය තුළ ඔවුන්ට මුහුණ දීමට සිදුවන නව අද්දැකීම් අභියෝගාත්මක විය හැකි ය. එය බිය, තැතිගැන්ම වැනි මානසික තත්වයන් ඇති කරන්නට ද හේතු විය හැකි ය. මෙවැනි අභියෝගාත්මක අද්දැකීම් සිසුන්ගේ අඛණ්ඩ සංවර්ධනයට බාධාකාරී විය හැකි ය. එමනිසා නිල ඇඳුම් රහිත ව අලුත් පාසල් පරිසරයකට පිවිස ඉතාමත් සරල ක්‍රියාකාරකම් සමූහයක් අලුතින් හමුවන ගුරුතුමිය සහ අලුතින් හමුවන යහලු යෙහෙළියන් සමග සිදු කිරීමට අවස්ථාව සැලසීම මගින් අපේක්ෂා කෙරේ. එමගින් පාසල පිළිබඳ ධනාත්මක ආකල්ප ගොඩනැගීම මෙන් ම පාසල් අධ්‍යාපනය සඳහා ප්‍රීතිමත් ආරම්භයක් සලසා දීම ද අපේක්ෂා කෙරේ.

එසේම පළමුවැනි ශ්‍රේණියේ ගුරුවරයාට ද අලුත් සිසුන් සමූහයක් සමග ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භ කිරීම අභියෝගාත්මක අද්දැකීමක් විය හැකි ය. තම පන්තියට අලුතින් ඇතුළත් වන සිසුන්ගේ අවශ්‍යතා, රුචි අරුචිකම්, ප්‍රබලතාවන් හා සංවර්ධනය විය යුතු කුසලතා පිළිබඳ සැලකිලිමත් ව තම ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම ගුරුවරයා විසින් සිදුකළ යුතුය. එමෙන් ම සිසුන් හා සම්බන්ධ මූලික තොරතුරු ලබා ගැනීමට අවස්ථාව සලසා දීම ද මෙම වැඩසටහනෙන් ළඟා කර ගැනීමට අපේක්ෂිත තවත් එක් අරමුණකි.

පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් වන සිසුන් අතර පෙර පාසල් අද්දැකීම් ලැබූ හා නොලැබූ, ගම්බද හා නගරබද, පහසුකම් වැඩි හා අඩු ආදී විවිධ පරිසර තත්වයන් යටතේ පසුවන දරුවෝ ද සිටිති. මෙ-වැනි සියලු දරුවන්ගේ ප්‍රබලතා නිවැරදි පරිදි දිශාභිමුඛ කිරීමත්, සංවර්ධනය විය යුතු කුසලතා සඳහා මැදිහත් වීමත් ගුරුවරයා විසින් සිදු කළ යුතු ය. එවැනි මැදිහත්වීම් තුළින් සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකි බව බොහෝ පර්යේෂණ මගින් ද තහවුරු කර ඇත. එසේම දරුවන් තුළ සංවර්ධනය කළයුතු

මූලික කුසලතා කුඩා අවධිය තුළදී ම සංවර්ධනය නොකළ හොත් ජීවිතයේ පසු අවධිවලදී එම කුසලතා සංවර්ධනය කිරීම දුෂ්කර විය හැකි බව මනෝ විද්‍යාඥයන් විසින් ද පෙන්වා දී ඇත.
මෙම වැඩසටහන මගින් සිසුවා ප්‍රීතිමත් විනෝද ජනක ඉගෙනුම් පරිසරයකට පැමිණ ඇති බව සිසුවාට ඒත්තු ගැන්වෙන ආකාරයට ගුරුවරයා විසින් කටයුතු කළ යුතුය.

### 3. දරුවන් හඳුනා ගැනීම සඳහා පාසල සූදානම් විය යුතු ආකාරය

- විදුහල්පතිවරයාගේ මූලිකත්වයෙන් මෙම වැඩසටහන සැලසුම් සහගත ව හා සංවිධානාත්මක ව ක්‍රියාත්මක විය යුතු ය.
- පළමුවන ශ්‍රේණියේ/පළමුවන ප්‍රධාන අවධියේ ගුරුවරුන් විදුහල්පති සහ පාසලේ පරිපාලනය සමග සාකච්ඡා කොට මෙම වැඩසටහන සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු ය. පාසල තුළ පැවතිය යුතු සූදානම හඳුනා ගැනීමට යොදා ගත හැකි පත්‍රිකාවක් ද මෙහි ඇතුළත් වෙයි. (අමුණුම 01)
- පළමුවැනි ශ්‍රේණිය සඳහා ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ලත් දරුවන් පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් කාලයකට පෙර ලබා ගෙන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා පෙර සූදානමක් ඇතිකර ගත යුතු ය.
- විධිමත් පාසලේ පළමුවන ශ්‍රේණියේ අධ්‍යයන කටයුතු ආරම්භයට ප්‍රථම මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම අවශ්‍ය ය.
- මෙම වැඩසටහනෙහි අරමුණු හා ක්‍රියාමාර්ග පිළිබඳ දෙමව්පියන් දැනුවත් කර ලබා දී ඇති උපදෙස්වලට අනුව වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු ය.
- විදුහල්පති හෝ ප්‍රාථමික අංශයේ විදුහල්පතිගේ අධීක්ෂණයෙන් යුතු ව පාසලේ අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලියේ කොටසක් ලෙස මෙය ක්‍රියාත්මක විය යුතු ය.
- මෙය සිසු මට්ටම් තීරණය කරනු ලබන පරීක්ෂණයක් නො වේ. සිසුන් එකිනෙකා සංසන්දනය කරන වැඩසටහනක් ලෙස දෙමව්පියන් තුළ මෙන් ම සිසු දරු දැරියන් තුළ ද හැඟීමක් ඇති නොවන පරිදි මෙම වැඩසටහක ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.
- මෙය ගුරුවරයාගේ ඉදිරි ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීම හා විවිධත්වයට අනුව ඉගෙනුම් අවස්ථා නිර්මාණය කර ගනිමින්, අවස්ථා හා විසඳුම් සැලසීම සඳහා පමණක් ම භාවිත කළ යුතුය. කිසිදු හේතුවක් මත ඉදිරි ඉගෙනුම සූදානම සඳහා සිදු කරනු ලබන දරුවන් සඳහා මුල් අදියරේ හඳුනා ගැනීම අවබෝධය පිළිබඳ ප්‍රසිද්ධියට පත් කිරීම නොකළ යුතු ය.

### 4. ගුරුවරයා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

- සිසුන් විවිධ බවත් ඔවුන් එකිනෙකා තුළ වෙනස් විභවතා ඇති බවත් එම විවිධතා හා විභවතා පන්ති කාමරය තුළ යහපත් මෙන් ම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරයක් ඇති කරන බවත් ගුරුවරයා විසින් අවබෝධ කර ගත යුතු ය.
- පළමුවැනි ශ්‍රේණියට ඇතුළත්වන සිසුන්ගේ විවිධත්වයන් ගැන අවබෝධයක් ලබා ගැනීමට ගුරුවරයාට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම වැඩසටහනේ එක් ප්‍රධාන අරමුණක් බැවින් වැඩසටහන ආරම්භයේ සිට අවසානය දක්වා ම පන්තිභාර ගුරුවරයා මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය.
- සිසුන්ට නිදහසේ පහසුවෙන් ක්‍රියාකාරකම්වල යෙදීමට ප්‍රමාණවත් කාලයක් ලබාදෙමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය. සමස්ත වැඩසටහන සඳහා යටත් පිරිසෙයින් සති දෙකක කාලයක් යොදා ගැනීම සුදුසු ය.
- මෙම වැඩසටහන ප්‍රීතිජනක අවස්ථා ගොඩනගා ගනිමින් සිසුන් සමග සමීප ව කටයුතු කරන අවස්ථාවක් බවට පත්කර ගත යුතුය.
- සිසුන් සමග කුඩා කණ්ඩායම් ලෙස කටයුතු කරන අවස්ථාවලදී අවශ්‍ය පරිදි වෙනත් ගුරුවරයෙකුගේ සහාය ලබාගත හැකි ය. විශේෂයෙන් ම පළමුවන ශ්‍රේණිය භාර ගුරුවරයා සිසුන් කණ්ඩායමක් සමග මෙම වැඩ සටහනට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන විට අනෙක් සිසුන් වෙනත් ක්‍රියාකාරකමක (මෙම වැඩ සටහනට අදාළ නොවන) යෙදවීම සඳහා වෙනත් ගුරුවරයෙකු/ගුරු සහායකයකුගේ උදවු අවශ්‍ය වනු ඇත.
- පාසල් සමාජයට ගැලපෙන පහසු ඇඳුමකින් සැරසී මෙම වැඩසටහනට සහභාගි වීමට සිසුන්ට ඉඩ

ප්‍රස්ථා ලබා දීම සිසුන්ට ක්‍රියාකාරකම්වල නියැලීමට පහසුවක් වනු ඇත.

- සිසුන් නමින් හඳුනා ගැනීම පහසුවීම සඳහා ඔවුන්ගේ නම සඳහන් කාඩ්පත් පිළියෙල කර පලඳවන්න.
- සිසුන් සමග ක්‍රියාකාරකම්වල යෙදෙන විට ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කරන්න.
- ඉතා පහසුවෙන් පරිසරයෙන් සොයා ගත හැකි ද්‍රව්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිත කිරීම සුදුසු ය. විශේෂයෙන් 'සෙල්ලම් ගෙදර' තාවකාලික ව, එහෙත් දරුවන්ට ප්‍රියමනාප වන පරිදි සකස් කළ යුතු වන අතර විශාල වියදම් දරමින් සකස් කරන ලද කූඩාරම් යොදා ගැනීමෙන් වැළකිය යුතු ය.

**5 ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

- පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් වූ සිසුන් 10 දෙනා බැගින් කණ්ඩායම් කරන්න. ඒ එක් එක් කණ්ඩායමක් (10 දෙනා බැගින්) සඳහා ක්‍රියාකාරකම් 10 ම සම්පූර්ණ කිරීම අවශ්‍ය වෙයි. අවශ්‍ය තන්හිදී කුඩා කණ්ඩායම් වශයෙන් යොදා ගැනීම සුදුසු ය. ඇතුළත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව අඩු නම් අදාළ පරිදි එක් කණ්ඩායමකට ඇතුළත් කරන සංඛ්‍යාව තීරණය කිරීම කළ යුතු ය.
- 'සෙල්ලම් ගෙදර - සෙල්ලම් කරමු' යන ක්‍රියාකාරකම සිසුන් සමග මුලින් ම සම්පූර්ණ කළ යුතු ක්‍රියාකාරකම වන අතර ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් යොදා ගැනීම සුදුසු ය.
- "සතුටු වෙමු" ක්‍රියාකාරකම තම පන්තියේ සියලු ම සිසුන් සමග එක ම දිනයකදී අවසාන ක්‍රියාකාරකම වශයෙන් ක්‍රියාත්මක කිරීම සුදුසු ය.
- අනෙකුත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා නිශ්චිත අනුපිළිවෙළක් නැත. ඒ සඳහා අනුගමනය කළ හැකි සැලැස්මක් ඊළඟ පිටුවේ දක්වා ඇත.
- ක්‍රියාකාරකම් හොඳින් කියවා අවබෝධයෙන් යුතු ව ඒවා සිසුන් සමග ක්‍රියාත්මක කළ යුතු ය.

**6 දරුවන් පිළිබඳ වාර්තා තබා ගැනීම**

- ක්‍රියාකාරකම් සම්බන්ධව සිසුන් දක්වන කුසලතා පහත සඳහන් මට්ටම් යටතේ වාර්තා කර ගත යුතු ය.
  - √ සතුටුදායකයි
  - ● සංවර්ධනය වීම අවශ්‍යයි.
- තක්සේරු කිරීමේදී හරි ලකුණ හා තිත් ලකුණ ලැබූ සියලු සිසුන් පිළිබඳ අවධානයකින් යුතු ව ඔවුන් සැමට උචිත පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු ය.

**7. ක්‍රියාකාරකම් හා සම්බන්ධ ක්ෂේත්‍ර**

| ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම් |
|---|---|
| චාලක කුසලතා | දුවමු , පනිමු , නගිමු |
| | කොළ ගුළි කරමු අලවමු<br>කපා අලවමු<br>මල් හදමු |
| ප්‍රජානන කුසලතා | කොටස් ගලපමු,<br>වර්ණ සහ රටා හඳුනා ගනිමු, |
| සමාජ කුසලතා | සෙල්ලම් ගෙදර - සෙල්ලම් කරමු |
| භාෂා කුසලතා | සිද්ධියක්/කතාවක් ගොඩ නගමු |
| වින්දනාත්මක කුසලතා | සතුටු වෙමු |
| පෞද්ගලික සුව පැවැත්ම හා යහ පුරුදු ඉගෙනීමට නැඹුරු වූ කුසලතා | සුව පැවැත්ම හා යහ පුරුදු ඉගෙනීමට නැඹුරු වෙමු |

පළමුවැනි ශ්‍රේණියට අලුතින් ඇතුළත් වන දරුවන් පාසල් අධ්‍යාපනයට කොතරම් සූදානම් දැයි හඳුනා ගැනීම සඳහා ඔබට උදවු කරගත හැකි ක්‍රියාකාරකම් 10ක් ඉදිරිපත් කර ඇත. එම ක්‍රියාකාරකම් ප්‍රධාන ක්ෂේත්‍ර 6කට සම්බන්ධ වෙයි. ක්‍රියාකාරකම් හා ඒවාට අදාළ ක්ෂේත්‍ර ඉහත දැක්වෙන පරිදි සම්පිණ්ඩනය කොට ඉදිරිපත් කළ හැකි ය.

**8. ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ආදර්ශ සැලැස්මක්**

<table>
<tr><th>පළමු දිනය</th><th>දෙවන දිනය</th><th>තුන්වන දිනය</th><th>හතරවන දිනය</th></tr>
<tr><td rowspan="2">සෙල්ලම් ගෙදර - සෙල්ලම් කරමු</td><td>වර්ණ සහ රටා හඳුනා ගනිමු</td><td>කොටස් ගලපමු</td><td rowspan="4">සතුටු වෙමු</td></tr>
<tr><td>දුවමු පනිමු නගිමු</td><td rowspan="3">සිද්ධියක් කතාවක් ගොඩනගමු</td></tr>
<tr><td>කොළ ගුළි කරමු අලවමු</td><td rowspan="2">කපා අලවමු</td></tr>
<tr><td>මල් හදමු</td></tr>
</table>

මෙම යෝජිත සැලස්ම ක්‍රියාත්මක කිරීමේදී පළමු වන ක්‍රියාකාරකම හා අවසාන ක්‍රියාකාරකම හැර අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා නිශ්චිත අනුපිළිවෙළක් නැත.

**9. ක්‍රියාකාරකම්**

දරුවන් හඳුනා ගැනීම සඳහා සකස් කරන ලද ක්‍රියාකාරකම් පහත ඇතුළත් කර ඇත. මෙම ක්‍රියාකාරකම් පූර්ව සූදානමකින් යුක්ත ව ප්‍රීතිජනක අවස්ථා ගොඩනගා ගනිමින් දරුවන් සමග සමීප ව කටයුතු කරන අවස්ථාවක් බවට පත්කර ගත යුතු ය.

**ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා උපදෙස්:**

- මෙහි සඳහන් සියලු ක්‍රියාකාරකම් සිදු කිරීමේදී සිසුන්ට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- සෑම ක්‍රියාකාරකම ආරම්භයේ සිට අවසානය තෙක් සිසුන්ගේ ක්‍රියාකාරීත්වය හා හැසිරීම් නිරන්තරයෙන් නිරීක්ෂණය කරන්න.
- ක්‍රියාකාරකම ඉක්මනින් සිදු කිරීමට සිසුන්ට බලපෑමක් නොකරන්න. මන්ද, මෙම වැඩසටහන තුළින් හඳුනා ගැනීමට අපේක්ෂා කරනු ලබන්නේ සිසුන් මේ දක්වා සංවර්ධනය කර ගෙන ඇති ඒ ඒ ක්ෂේත්‍රවලට අයත් කුසලතාවල මට්ටම පමණි.
- සිසුන් එකිනෙකා සන්සන්දනය කිරීමෙන් තොර ව ලබා දී ඇති නිර්ණායකවලට අනුව තක්සේරු කිරීම සිදු කරන්න.
- මෙහි සඳහන් එක් එක් ක්‍රියාකාරකමක යෙදෙන සිසුන් නිරීක්ෂණය කරමින්, නිරීක්ෂණ පත්‍රිකාවේ අදාළ නිර්ණායකයන්ට අනුව එම අවස්ථාවේදී ම වාර්තා තබා ගන්න.
- තනි තනි ව සිසුන් තක්සේරු කිරීම් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වලදී වෙනත් ගුරුවරයෙකු ගේ සහයෙන් අනෙක් සිසුන් අර්ථවත් යමකට අවධානයෙන් යුතු ව තැබීමට වග බලා ගන්න.

# 1. සෙල්ලම් ගෙදර සෙල්ලම් කරමු.

| ක්ෂේත්‍රය | සමාජ කුසලතා |
|---|---|
| ක්‍රියාකාරකම | සෙල්ලම් ගෙදර සෙල්ලම් කිරීම |
| තක්සේරු නිර්ණායක | ■ අන් සිසුන් සමග සුහද කතාබහේ යෙදෙයි<br>■ අන් සිසුන් සමග සහයෝගයෙන් ක්‍රියා කරයි.<br>■ අන් සිසුන්ට කැමැත්තෙන් උදවු ලබා දෙයි.<br>■ අන් සිසුන් සමග ද්‍රව්‍ය හුවමාරු කර ගනියි. |
| අවශ්‍ය ද්‍රව්‍ය | වතුර බේසම්, ටින්, ප්ලාස්ටික් කෝප්ප, යෝගට් කෝප්ප, ප්ලාස්ටික් බෝතල්, පුනීල, හැඳි, කුඩා බෝනික්කන්, පරණ ඇඳුම්, හිස් පවුඩර් පෙට්ටි, බෑග්, තොප්පි, කුඩා කොට්ටයක්, සාරි තොටිල්ලක්, කුඩා වළං, පොල්කටු, වැලි, විවිධ සෙල්ලම් බඩු, මැටි, ලෑලි කෑලි, ඉටි රෙදි, පිටි ගුළි, ඉරටු, ලී කුට්ටි, ලී රෝද, ප්ලාස්ටික් බෝල, ඩීන්ස් කැට, ටොනික් මූඩි, දත් බෙහෙත් ටියුබ්වල මූඩි, පස්, පොල්කුඩු, සැබෑ මල්, ඉරටු, කොස් කොළ, වැලි දැමූ ටින්...වැනි ඔබ ප්‍රදේශයෙන් පහසුවෙන් සපයා ගත හැකි සිසුන්ට ගැළපෙන වෙනත් ඕනෑ ම ද්‍රව්‍යයක් සෙල්ලම් ගෙදර සෙල්ලම් කිරීම සඳහා බොහෝ ද්‍රව්‍ය තිබීම සුදුසු ය. ද්‍රව්‍ය රැස්කර ගැනීම ගුරුවරයාට පහසු ඕනෑ ම ආකාරයකින් සිදු කරගත හැකි ය. එහෙත් මෙම ද්‍රව්‍ය "දරුවා හඳුනා ගැනීමේ වැඩසටහන" සඳහා සහභාගී වන සිසුන් හෝ ඔවුන්ගේ දෙමව්පියන් විසින් ගෙන්වා ගත යුතු නැත. මන්ද සිසුන් ක්‍රියාකාරකම්වල දී තමන් විසින් ගෙන එන ලද දේවල් අයිති කර ගැනීමට උත්සාහ දැරිය හැකි බැවිනි. |
| පූර්ව සූදානම | ගුරුවරයාට නිරීක්ෂණය කිරීමට පහසු වන පරිද්දෙන්, කැඳවන සිසු සංඛ්‍යාවට ප්‍රමාණවත් ඉඩකඩ සහිත ව සෙල්ලම් ගෙවල් සකස් කර ගන්න. පරිසරයේ තිබෙන සම්පත් භාවිත කරමින් අඩු වියදමින් තාවකාලික සෙල්ලම් ගෙවල් සකස් කර ගන්න.<br><br>සමාන ලෙස හා ප්‍රමාණවත් ලෙස ලැබෙන සේ රැස්කර ගත් ද්‍රව්‍ය සෑම සෙල්ලම් ගෙදරක ම තබන්න. |
| ස්ථානය | සෙල්ලම් ගෙදර |

**ක්‍රමවේදය**

**පියවර i**

- සෙල්ලම් ගෙදර තබා ඇති ද්‍රව්‍ය භාවිත කරමින් තම තමන් කැමති ආකාරයකට සෙල්ලම් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසු කුසලතා නිරීක්ෂණයට පහසු වන සේ අවශ්‍ය පෙලඹවීම් කිරීම කෙරෙහි ගුරු අවධානය යොමු කළ හැකි ය.

**ගුරුවරයා විසින් නිරීක්ෂණය කළ යුතු දේ :**

- අන් සිසුන් සමග සුහද කතාබහේ යෙදෙන්නේ ද?
- අන් සිසුන් සමග සහයෝගයෙන් ක්‍රියා කරන්නේ ද?
- අන් සිසුන්ට කැමැත්තෙන් උදවු ලබාදෙන්නේ ද?
- අන් සිසුන් සමග ද්‍රව්‍ය හුවමාරු කර ගන්නේ ද?

## 2. කොළ ගුලි කරමු අලවමු

| | |
|---|---|
| ක්ෂේත්‍රය | චාලක කුසලතා |
| ක්‍රියාකාරකම | කොළ ගුළි කිරීම, ඇලවීම |
| තක්සේරු නිර්ණායක | ■ කඩදාසියක් සියුම් කැබලිවලට ඉරයි<br>■ ඉරූ කඩදාසි කැබලි බෝල ලෙස ගුළි කරයි.<br>■ සපයන ලද හැඩයෙහි දාර දිගේ ගුළිකළ බෝල අලවයි<br>■ රූපයේ නිමාව ගැන සැලකිළිමත් වෙයි |
| අවශ්‍ය ද්‍රව්‍ය | කඩදාසි ගුළි කර දැමීම සඳහා ප්ලාස්ටික් පිඟන්, සුදු පාට සවි කඩදාසි, ගම්, සරල හැඩයක් (වෘත්ත, සමචතුරශ්‍ර ආදී සරල හැඩ) අඳින ලද A4 ප්‍රමාණයේ වර්ණ කඩදාසි |
| පූර්ව සූදානම | දිග සෙ. මී. 30, පලළ සෙ. මී. 30 ප්‍රමාණයේ සවි කඩදාසි සිසු සංඛ්‍යාවට ප්‍රමාණවත් පරිදි සපයා ගන්න.<br><br>අවශ්‍ය අනෙක් ද්‍රව්‍ය ද සපයා ගන්න. |
| ස්ථානය | පන්ති කාමරය |

**ක්‍රමවේදය**

පියවර i

- සෑම සිසුවකුට ම සරල හැඩයක් (විශ්කම්භය සෙමී.12 පමණවන වෘත්තයක් , දිග සෙමී.12 පමණවන සමචතුරශ්‍රයක්... වැනි) අඳින ලද A4 ප්‍රමාණයේ වර්ණ කඩදාසියක්, ගම්, සුදු පැහැති සවි කඩදාසියක් බැගින් ලබා දෙන්න.
- සවි කඩදාසිය කුඩා කැබලිවලට ඉරන්නට හා ඉරන ලද කැබලි ගුළි වශයෙන් සකස් කරන්නට උපදෙස් ලබා දෙන්න.
- ගුළිකළ බෝල ප්ලාස්ටික් පිඟානට දමන්නට උපදෙස් දෙන්න.
- ලබා දුන් හැඩයෙහි දාර මත ගුළි කළ කඩදාසි බෝල අලවන්නට කියන්න.
- මේ සඳහා ප්‍රමාණවත් කාලයක් සිසුන්ට ලබාදෙන්න.
- සිසුන්ගේ නිර්මාණ නිරීක්ෂණය කරමින් අගය කරන්න.

**ගුරුවරයා විසින් නිරීක්ෂණය කළ යුතු දේ:**


- කඩදාසිය සියුම් කැබලිවලට ඉරිය හැකිද?
- ඉරන ලද කඩදාසිවලින් කුඩා ගුළි සකස් කරන්නේ ද?
- ගුළි කළ බෝල සපයන ලද හැඩය වටා ඇලවිය හැකි ද?
- හැඩය වටා සම්පූර්ණයෙන් ම ගුළි අලවන්නේ ද?

# 3. මල් හදමු

| | |
|---|---|
| ක්ෂේත්‍රය | චාලක කුසලතා |
| ක්‍රියාකාරකම | මල් හැදීම |
| තක්සේරු නිර්ණායක | ■ කොළයේ දිග අතට තීරුවක් නවයි.<br>■ කොළය හරස් අතට තබා ගෙන කුඩා තීරුවලට ඉරයි.<br>■ කුඩා තීරු ලෙස ඉරන ලද කඩදාසිය එකතු කර මලක් සාදයි. |
| අවශ්‍ය ද්‍රව්‍ය | A4 කඩදාසියේ ප්‍රමාණයට පහසුවෙන් ඉරිය හැකි කඩදාසි |
| පූර්ව සූදානම | කැඳවන ලද සිසුන් සුදුසු පරිදි අසුන් ගන්නට යොමු කරන්න. සෑම සිසුවෙකුට ම කඩදාසියක් බැගින් බෙදා දෙන්න. |
| ස්ථානය | පන්ති කාමරය |

**ක්‍රමවේදය**

**පියවර i**




- ■ ඉහත රූපයේ දැක්වෙන ආකාරයට A4 කඩදාසියේ ප්‍රමාණයේ කඩදාසිය සෙන්ටි මීටර් පහක් පමණ ප්‍රමාණයක් නවන්න.
- ■ කඩදාසිය මේසය මත තබා කුඩා තීරුවලට ඉරීමට සිසුන් යොමු කරන්න. (AB රේඛාව තෙක්)
- ■ ඉරීම සඳහා රේඛා ඇඳ ලබා නොදිය යුතුය.

පියවර ii
- ■ ඉරා ගත් කොටසේ යට ඉතිරි වූ කොටසින් (නැවූ කොටස) අල්ලා මලක් ලෙස එකතු කරන ලෙස උපදෙස් දෙන්න.

පියවර iii
- ■ සිසුන් සියලු දෙනා සැකසූ මල් එකතු කර අලංකාර මල් බඳුනක්/මල්වට්ටියක් සකස් කර ප්‍රදර්ශනය කරන්න (මෙය ගුරුවරයා විසින් සිදු කළ යුතු ය).

**ගුරුවරයා විසින් නිරීක්ෂණය කළ යුතු දේ :**
- ■ කොළය දිග අතට තීරුවක් ලෙස නැමීමට හැකි වූයේ ද?
- ■ කොළය හරස් අතට කුඩා තීරුවලට ඉරීමට හැකි වූයේ ද?
- ■ තීරු ලෙස ඉරන ලද කඩදාසිය එකතුකර මලක් ලෙස සකස් කළ හැකිවූයේ ද?

**සැලකිය යුතුයි :**

"මල් හදමු" ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කරනු ලබන්නේ සිසුන්ගේ සියුම් චාලක කුසලතා හඳුනා ගැනීම යි. මෙහි දක්වා ඇති ක්‍රියාකාරකම ඒ සඳහා උදාහරණයක් පමණි. එම කුසලතා හඳුනාගත හැකි ආකාරයේ වෙනත් ඕනෑ ම ක්‍රියාකාරකමක් නිර්මාණය කර ගැනීමේ නිදහස ඔබට ඇත.

## 4. වර්ණ සහ රටා හඳුනා ගනිමු.


| | |
|---|---|
| ක්ෂේත්‍රය | ප්‍රජානන කුසලතා |
| ක්‍රියාකාරකම | වර්ණ සහ රටා හඳුනා ගැනීම |
| තක්සේරු නිර්ණායක | ▪ පළමුවැනි රටාවට ගැළපෙන ඊළඟ රූපය නිවැරදි ව තෝරයි.<br>▪ පළමුවැනි රටාව නිවැරදි ව සම්පූර්ණ කරයි.<br>▪ දෙවැනි රටාවට ගැළපෙන ඊළඟ රූපය නිවැරදි ව තෝරයි.<br>▪ දෙවැනි රටාව නිවැරදි ව සම්පූර්ණ කරයි.<br>▪ වර්ණ නිවැරදි ව හඳුනා ගනියි. |
| අවශ්‍ය ද්‍රව්‍ය | එක සමාන දිගක් ඇති ඉරටුවල ගසන ලද වර්ණ දෙකක මල් 7ක් (උදා: 4 + 3) හා එක ම වර්ණයක තරු 4ක් හා සඳවල් 3 (රූපවල විෂ්කම්භය සෙන්ටිමීටර 10ක් පමණ විය යුතු ය).<br>(මේ සඳහා වර්ණ යොදා ගැනීමේදී රතු, නිල්, කහ වැනි වර්ණ යොදා ගන්න)<br>වැලි පිරවූ එක සමාන ටින් 6ක්. |
| පූර්ව සූදානම | කපා ගත් මල් සහ කොළ ඉරටුවලට සවි කරන්න. සුදු හෝ එක ම වර්ණයක කොළවලින් ටින් ආවරණය කොට වැලිවලින් පුරවන්න. ළමා මේස 2ක් පමණ අදාළ ස්ථානයේ තබන්න. |
| ස්ථානය | පන්ති කාමරයෙන් පිටත ආසන්න තැනක් |

**ක්‍රමවේදය**

**පියවර i**

පහත රූපයේ දක්වා ඇති ආකාරයට වැලි පිරවූ ටින් 5ක වර්ණ දෙකක මල් ගසා ද එක ටින් එකක් මල් නොගසා ද මේස මත පිළිවෙළට තබන්න.

**පළමුවැනි රටාව**



පියවර ii

- ඉරටුවල ගසන ලද රතු හා කහ මල් දෙකක් සිසුවාට ඉදිරියෙන් තබන්න.

පියවර iii

- සිසුන් පන්ති කාමරයේ රඳවා එක් එක් සිසුවා බැගින් ක්‍රියාකාරකම සඳහා අදාළ තැනට කැඳවා ගන්න.
- පන්තියේ රැඳෙන සිසුන් සුදුසු ක්‍රියාකාරකමක යොදවන්න.


පියවර iv

- එක් එක් සිසුවාට දී ඇති රටාවට අනුව ගැළපෙන මල ගසන ලද ඉරටුව තෝරා ගෙන ගොස් වැලි පිර වූ ටින් එකෙහි ගසන්නට උපදෙස් දෙන්න.
- රූපය සහිත ඉරටුව ටින් එකෙහි රැඳ වූ පසු එම රූපවල වර්ණ මොනවා දැයි විමසන්න.
- ඊළඟ දරුවා කැඳවීමට පෙර නැවතත් අවසාන ටින් එක හිස් ව තබන්න.

පියවර v

- වරකට එක් සිසුවකු බැගින් සිසුන් සියලු දෙනාට ම අවස්ථාව ලබා දෙමින් ක්‍රියාකාරකම සිදු කරන්න.
- නිරීක්ෂණ සටහන් කර ගන්න.

දෙවැනි රටාව



පියවර i

- ඉහත රූපයේ දැක්වෙන අන්දමට තරුවක් හා හඳක් වශයෙන් රටාව වෙනස් කර පෙර පරිදි ම සකස් කළ රූප, ටින්වල ගසන්න.

පියවර ii

- ඉතිරි රූප දෙක සහිත ඉරටු දෙක දරුවා ඉදිරියෙන් තබන්න. (මේ සඳහා එක ම වර්ණයේ වෙනත් හැඩ දෙකක් වුව ද යොදා ගත හැකි ය.)
- පෙර පරිදි ම ක්‍රියාකාරකම සම්පූර්ණ කරන්න. රූපය සහිත ඉරටුව ටින් එකෙහි රැඳ වූ පසු එම රූපවල වර්ණ මොනවාද යන්න විමසන්න.
- නිරීක්ෂණ සටහන් කර සටහන් ගන්න.

**ගුරුවරයා විසින් නිරීක්ෂණය කළ යුතුදේ**

- පළමු ක්‍රියාකාරකමෙහි රටාව හඳුනා ගෙන එම රටාවේ ඊළඟට තැබිය යුතු රූපය නිවැරදි ව තෝරා අදාළ ටින් එකෙහි රඳවන්නේ ද?
- දෙවැනි ක්‍රියාකාරකමෙහි රටාව හඳුනා ගෙන එම රටාවේ ඊළඟට තැබිය යුතු රූපය නිවැරදි ව තෝරා අදාළ ටින් එකෙහි රඳවන්නේ ද?
- පළමුවැනි සහ දෙවැනි රටා සඳහා යොදා ගන්නා ලද රූපවල වර්ණ නිවැරදි ව ප්‍රකාශ කරයි ද?

## 5. දුවමු, පනිමු, නගිමු

| | |
|---|---|
| ක්ෂේත්‍රය | චාලක කුසලතා |
| ක්‍රියාකාරකම | දිවීම පැනීම නැගීම |
| තක්සේරු නිර්ණායක | ■ කෙටි දුරක් දුවයි. (මීටර් දහයක් පමණ)<br>■ දෙපා එක තැනෙක තබා ගෙන කෙටි දුරක් ඉදිරියට පනියි.<br>■ නැගුම් රාමුවේ නැග පහළට බසියි.<br>■ සමබර දණ්ඩ මත එක් කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා ගමන් කරයි.<br>■ සහයෝගයෙන් සෙල්ලම් මිදුලෙහි උපකරණ පරිහරණය කරයි.<br>■ සෙල්ලම් මිදුලෙහි උපකරණ භාවිත කිරීමේදී තමන්ගේ වාරය එනතුරු සිටියි.<br>■ සෙල්ලම් මිදුලෙහි උපකරණ ආරක්ෂාකාරී ලෙස පරිහරණය කරයි. |
| අවශ්‍ය ද්‍රව්‍ය | සෙල්ලම් මිදුලේ උපකරණ |
| පූර්ව සූදානම | සෙල්ලම් මිදුලට අයත් භූමිය සහ උපකරණ සිසුන්ගේ භාවිතයට සුදුසු ආරක්ෂාකාරී මට්ටමක තිබේ දැයි සිසුන් ක්‍රියාකාරකමෙහි යෙදීමට ප්‍රථම තහවුරු කර ගන්න.<br>ගුරුවරයාට නිරීක්ෂණය කළ හැකි සිසුන් සංඛ්‍යාවක් සමග ක්‍රියාකාරකම් සඳහා සූදානම් වන්න.<br>සෙල්ලම් මිදුලෙහි සිසුන් ගත කරන මුළු කාලය ම ගුරුවරයාගේ නිරීක්ෂණයට ලක් විය යුතු ය. |
| ස්ථානය | සෙල්ලම් මිදුල |

**ක්‍රමවේදය**

**පියවර i**

- සිසුන් කණ්ඩායම සෙල්ලම් මිදුලට රැගෙන යන්න.
- සිසු කැමැත්ත පරිදි උපකරණ ආශ්‍රිත ව සෙල්ලම් කිරීම සඳහා යොමු කරන්න.
- මෙහිදී සෑම සිසුවෙකුට ම සෙල්ලම් මිදුලේ සියලු උපකරණ පරිහරණය කිරීමට අවස්ථා සලසන්න.
- යම් උපකරණයක් පරිහරණය කිරීමට අකමැත්තක් දක්වන සිසුන් සිටී නම් එවැනි සිසුන්ට බලපෑම් නොකරන්න.

**පියවර ii**

- සිසුන් විවිධ උපකරණ සමග සෙල්ලම් කරන විට ගුරුවරයා ඔවුන් සමීප ලෙස නිරීක්ෂණය කළ යුතු අතර ඒ පිළිබඳ ව සටහන් තබා ගත යුතු ය.
- සිසුන්ට කෙටි දුරක් දුවගෙන යා හැකි ද යන්න නිරීක්ෂණය සඳහා මීටර් දහයක පමණ දුරකින් යුතු සීමාවක් සලකුණු කර ගන්න. ඔබට නිරීක්ෂණය කිරීමට පහසු සිසු සංඛ්‍යාවක් එම සීමාවේ එක් කෙළවරක සිට ගැනීමට සලස්වා සලකුණු කළ සීමාව තෙක් දුවගෙන යාමට සලස්වන්න.
- වරකට එක් සිසුවකු බැගින් කැඳවා ඔහුට/ඇයට කෙටි දුරක් ඉදිරියට පැනීමට හැකි දැයි පරීක්ෂා කරන්න.

**ගුරුවරයා විසින් නිරීක්ෂණය කළ යුතු දේ:**

- කෙටි දුරක් දුවගෙන යා හැකි ද? (මීටර් දහයක් පමණ)
- දෙපා එක තැනෙක තබා ගෙන එක් පිම්මකින් කෙටි දුරක් ඉදිරියට පැනීමට හැකි ද?
- නැගුම් රාමුවේ නැගීමට හා බැසීමට හැකිද?
- සමබර දණ්ඩ මත එක් කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා ගමන් කළ හැකි ද?
- සහයෝගයෙන් සෙල්ලම් මිදුලෙහි උපකරණ පරිහරණය කරන්නේ ද?
- සෙල්ලම් මිදුලෙහි උපකරණ භාවිත කිරීමේ දී තමන්ගේ වාරය එන තුරු සිටින්නේ ද?
- ආරක්ෂාකාරී ලෙස සෙල්ලම් මිදුලෙහි උපකරණ පරිහරණය කරන්නේ ද?

## 6. කපා අලවමු

| | |
|---|---|
| ක්ෂේත්‍රය | චාලක කුසලතා |
| ක්‍රියාකාරකම | කපා ඇලවීම |
| තක්සේරු නිර්ණායක | ■ දී ඇති සීමාව තුළ පාට කරයි.<br>■ කතුර නිවැරදි ව අල්ලයි.<br>■ දී ඇති සීමාව දිගේ කපයි.<br>■ කැපූ හැඩ තවත් කඩදාසියක් මත අලවයි. |
| අවශ්‍ය ද්‍රව්‍ය | විශ්කම්භය සෙ. මී. 10 ක වෘත්තයක් අඳින ලද A4 සුදු කඩදාසි, කතුරු, ගම්, පැස්ටල් |
| පූර්ව සූදානම | කතුරු, ගම්, A4 සුදු කඩදාසි ආදිය සෑම සිසුවකුට ම ප්‍රමාණවත් වන සේ සපයා ගන්න. |
| ස්ථානය | පන්ති කාමරය |

**ක්‍රමවේදය**

**පියවර i**

- සිසුන්ට පන්ති කාමරයේ එකිනෙකාට තරමක් දුරින් අසුන් ගන්නට උපදෙස් දෙන්න.

**පියවර ii**

- විෂ්කම්භය සෙන්ටිමීටර් දහයක් ප්‍රමාණයේ වෘත්තයක් ඇද ඇති A4 සුදු කඩදාසියක් බැගින් සිසුන්ට ලබා දෙන්න.

**පියවර iii**

- ලබා දුන් කඩදාසියේ ඇති වෘත්තය පාට කර ඒ වටා කතුරෙන් කැපීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. (කඩදාසිය අල්ලන අන්දම හා හැඩ සීමාව දිගේ කපන්නේ දැයි නිරීක්ෂණය කරන්න) ක්‍රියාකාරකම ආදර්ශනය කිරීමෙන් වලකින්න.

**පියවර iv**

- කපාගත් හැඩ ඇලවීමට තවත් සුදු පාට A4 කඩදාසිය බැගින් සෑම සිසුවකුට ම ලබා දෙන්න.

**පියවර v**

- කපාගත් හැඩ (රවුම) ලබාදුන් කඩදාසියේ අලවන ලෙස උපදෙස් දෙන්න.

**ගුරුවරයා විසින් නිරීක්ෂණය කළ යුතු දේ:**

- දී ඇති සීමාව තුළ සම්පූර්ණයෙන් පාට කරන්නේ ද?
- කතුර නිවැරදි ව අල්ලන්නේ ද?
- කතුර භාවිත කරමින් දී ඇති සීමාව දිගේ හැඩය කපන්නේ ද?
- කැපූ හැඩය දෙන ලද කඩදාසියේ අලවන්නේ ද?

## 7. කොටස් ගළපමු

| | |
|---|---|
| ක්ෂේත්‍රය | ප්‍රජානන කුසලතා |
| ක්‍රියාකාරකම | කොටස් ගැළපීම |
| තක්සේරු නිර්ණායක | ■ කොටස් දෙකකට කැපූ රූපය සම්පූර්ණ කරයි<br>■ කොටස් දෙකකට කැපූ රූපය නිවැරදි ව එක් රූපයක් ලෙස සම්පූර්ණ කරයි |
| අවශ්‍ය ද්‍රව්‍ය | කොටස් දෙකකට කපන ලද පලතුරක සරල රූපයක් |
| පූර්ව සූදානම | කොටස් දෙකකට කපන ලද පලතුරක සරල රූපයක් සපයා ගන්න |
| ස්ථානය | පන්ති කාමරය |

**ක්‍රමවේදය**

**පියවර i**

- එක් එක් සිසුවා බැගින් කැඳවා සකස් කරගන්නා ලද සරල රූපයේ කොටස් දෙක සිසුවාට ලබා දෙන්න.
- එය නිවැරදි ව එකතු කරන ලෙස සිසුවාට පවසන්න.

**පියවර ii**

- සිසුවා කොටස් දෙක එකතු කළ පසු සෑදෙන රූපය හඳුනා ගැනීමටත් සෑදෙන රූපය නම් කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.

**ගුරුවරයා විසින් නිරීක්ෂණය කළ යුතු දේ :**

- කොටස් දෙකකට කැපූ රූපය නිවැරදි ව එක් රූපයක් ලෙස සම්පූර්ණ කරන්නේ ද?
- සම්පූර්ණ කළ රූපය කුමක් දැයි පවසන්නේ ද?

## 8. සිද්ධියක්/කතාවක් ගොඩ නගමු.

| | |
|---|---|
| ක්ෂේත්‍රය | භාෂා කුසලතා |
| ක්‍රියාකාරකම | සිද්ධියක්/කතාවක් ගොඩ නැඟීම |
| තක්සේරු නිර්ණායක | ▪ දෙන ලද පින්තූර කාඩ්පතෙහි ඇති රූප නම් කරයි.<br>▪ රූප ඇසුරින් ගැළපෙන කතාවක් ඉදිරිපත් කරයි.<br>▪ කතාවේ කැමති අවස්ථාවක් චිත්‍රයකින් ඉදිරිපත් කරයි. |
| අවශ්‍ය ද්‍රව්‍ය | කතාවක් ගොඩ නැඟීමට සුදුසු ආකාරයේ සිද්ධි කීපයක් සහිත කාඩ්පතක් රූප කියවීම සඳහා සුදුසු කතන්දර පොත් |
| පූර්ව සූදානම | කතාවක් ගොඩ නැඟීමට සුදුසු ආකාරයේ සිද්ධි කීපයක් සහිත කාඩ්පතක් සකස් කරගන්න.<br>සිසුන්ට රූප කියවීම සඳහා සුදුසු මට්ටමේ කතන්දර පොත් කිහිපයක් සපයා ගන්න. |
| ස්ථානය | පන්ති කාමරය |

**ක්‍රමවේදය**

**පියවර i**

- එකම කතාවක අවස්ථා කිහිපයක් දැක්වෙන සේ රූප සහිත කාඩ්පත් සකස් කර ගන්න

(මෙම රූප නිර්මාණාත්මක ලෙස සිසු මට්ටමට ගැලපෙන සේ සකස් කරගත් ඒවා විය යුතුයි)
මේ සඳහා යොදාගත හැකි ආකාරයේ රූප සහිත කාඩ්පත් සඳහා ආදර්ශයක් පහත සඳහන් QR කේත මගින් දක්වා ඇත.

Channel NIE

- වරකට එක් සිසුවා බැගින් ගුරු මේසය අසලට කැඳවා සපයන ලද පින්තූර කාඩ්පත් නිරීක්ෂණය කරන ලෙසට උපදෙස් දෙන්න.
- එම පින්තූර කාඩ්පත්වල ඇති දේවල්/රූප කිහිපයක් නම් කරන ලෙස පවසන්න.
- එම පින්තූර කාඩ්පත්වල දැක්වෙන සිද්ධි ඇසුරින් තමාට රිසි පරිදි කතාවක් ගොඩනැඟීමට සිසුවාට අවස්ථාව ලබා දෙන්න.
- සපයා ගත් කතන්දර පොත් අනෙක් සිසුන්ට ලබා දෙන්න. ඒවා නිදහසේ එකිනෙකා අතර හුවමාරු කර ගනිමින් ඒවායෙහි ඇතුළත් රූප කියවීමට සිසුන් යොමු කරන්න.
- කතන්දරයෙහි තමා කැමති අවස්ථාවක් චිත්‍රයට නැඟීමට සෑම සිසුවෙකුට ම අවස්ථාව ලබා දෙන්න.

**ගුරුවරයා විසින් නිරීක්ෂණය කළ යුතු දේ:**

- පින්තූර කාඩ්පත්වල ඇති රූප නම් කරන්නේ ද? (අවමය රූප හතරක් නම් කළ යුතුයි)
- පින්තූර කාඩ්පත්වල දැක්වෙන රූප ඇසුරින් කතාවක් ගොඩනගන්නේ ද?

| |
|---|
| වැදගත් :<br>එක් සිසුවෙක් ඉදිරිපත් කරන කතාව අනෙක් සිසුන්ට නොඇසෙන ලෙස ප්‍රකාශ කිරීමට සුදුසු ස්ථානයක මෙම ක්‍රියාකාරකම සිදු කරන්න. |

## 9. සතුටු වෙමු.

සිසුන් සඳහා අවසාන දිනයේදී ක්‍රියාත්මක කිරීමට සුදුසු ක්‍රියාකාරකමකි. මෙම ක්‍රියාකාරකම සඳහා පන්තියේ සියලු ම සිසුන් සහභාගි කරවිය යුතු ය.

මෙම වැඩසටහන සඳහා කණ්ඩායම් වශයෙන් කැඳවන ලද සියලු සිසුන් මෙම දිනයේදී එකවර කැඳවිය යුතුය.

| | |
|---|---|
| ක්ෂේත්‍රය | වින්දනාත්මක කුසලතා |
| ක්‍රියාකාරකම | එක්ව සතුටු වීම |
| තක්සේරු නිර්ණායක | ■ පන්තිය ඉදිරියේ තනිව තමා කැමති ඉදිරිපත් කිරීමක් කරයි. (ගීතයක්/කවියක්)<br>■ අනෙකුත් සිසුන් සමග ගායනයෙහි යෙදෙයි. |
| අවශ්‍ය ද්‍රව්‍ය | වේදිකාව සැරසීමට අවශ්‍ය ද්‍රව්‍ය, මයික් එකක් හෝ මයික් එකක ආකෘතියක් |
| පූර්ව සූදානම | දර්ශනීය වේදිකාවක් පන්තියේ කෙළවරක හෝ නිදහස් තැනක සකස් කර ගන්න.<br>ඉදිරිපත් කිරීම් සඳහා අවශ්‍ය උපකරණ, (උදා: මයික් හෝ එවැනි ආකෘති) සපයා ගන්න |
| ස්ථානය | පන්ති කාමරය හෝ එළිමහන් තැනක සාදන ලද වේදිකාවක් |

**ක්‍රමවේදය**

**පියවර i**

- වේදිකාව මතට නැගී තමන් කැමති ගායනයක් ඉදිරිපත් කිරීමට එක් එක් සිසුවාට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් කැමති පරිදි චලන ද ඉදිරිපත් කිරීමට උනන්දු කරවන්න.

**පියවර ii**

- තමා ම ඉදිරිපත් වී ආත්ම විශ්වාසයකින් වේදිකාව මතට නැග ඉදිරිපත් කිරීම් කරන සිසුන් හඳුනා ගන්න.

**පියවර iii**

- උදවු අවශ්‍ය සිසුන් වේ නම් එම සිසුන්ට සහය වීමට අනෙක් සිසුන් දිරිමත් කරන්න.

**ගුරුවරයා විසින් නිරීක්ෂණය කළ යුතු දේ :**

- අනෙකුත් සිසුන් සමග ගායනයේ යෙදෙන්නේ ද?
- පන්තිය ඉදිරියේ ගායනයක් තනි ව කැමැත්තෙන් ඉදිරිපත් කරන්නේ ද? (ගීතයක්/කවියක්)

## 10. සුව පැවැත්මට සහ ඉගෙනීමට නැඹුරු වෙමු

සියලු ම ක්‍රියාකාරකම්වලදී දරුවන් පිළිබඳ නිරීක්ෂණය කොට ගුරුවරයා විසින් නිරීක්ෂණ සටහන් තබාගත යුතු ය. පහත දැක්වෙන කුසලතා සම්බන්ධ චර්යා නිරීක්ෂණයේදී සිසුන්ගේ එම චර්යා ඒ අයුරින් ම නිරීක්ෂණය කරනු මිස ඒවා වෙනස් කිරීමට ගුරුවරයා මැදිහත් නොවිය යුතු ය.

| | |
|---|---|
| ක්ෂේත්‍රය | සුව පැවැත්මට සහ ඉගෙනීමට නැඹුරු වූ කුසලතා |
| ක්‍රියාකාරකම | සුව පැවැත්මට සහ ඉගෙනීමට නැඹුරු වෙමු |
| තක්සේරු නිර්ණායක | ■ සුව පැවැත්ම හා යහපුරුදු (I)<br>■ පැරුද්දක් වශයෙන් ආහාර ගැනීමට පෙර හා පසු සබන් දමා නිවැරදි ව අත් සෝදයි.<br>■ අනෙක් අයගේ උදවු නොමැති ව ආහාර ගනියි.<br>■ අනුභව කිරීමේදී ආහාර සහ වතුර නොවිසුරුවයි.<br>■ පිරිසිදුකම පවත්වා ගනියි. (මුහුණ, හිස, නිය, දෙපා)<br>■ ඇඳුම්වල පිරිසිදුකම පවත්වා ගනියි.<br>■ ආචාරශීලී හැසිරීම් ප්‍රදර්ශනය කරයි. (Good Morning, ආයුබෝවන් ස්තුතියි වැනි)<br>■ තමාගේ අතපසුවීම්වලට සමාව ඉල්ලයි.<br><br>ඉගෙනීමට නැඹුරු වූ කුසලතා (II)<br>■ ක්‍රියාකාරකම්වලදී පරිහරණය කරන දේවල් පිළිවෙළකට තබයි.<br>■ ආරම්භ කරන ලද ක්‍රියාකාරකමක් නිමාවක් දක්වා සිදු කරයි.<br>■ උනන්දුවෙන් හා අවධානයෙන් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වෙයි.<br>■ ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ප්‍රීතිමත් හැසිරීම් ප්‍රදර්ශනය කරයි. |
| ස්ථානය | පන්ති කාමරය හා පන්ති කාමරයෙන් පිටත ක්‍රියාකාරකම්වල නියැලෙන ස්ථාන |

මෙම කුසලතා නිරීක්ෂණය කිරීම හා වාර්තා තබා ගැනීම සඳහා සුවිශේෂ ක්‍රියාකාරකම් නිර්මාණය කොට නැත. දරුවාගේ පාසලට ඇති සූදානම හඳුනා ගැනීම සඳහා වෙන් කොට ඇති දින හතරක කාලය තුළදී මෙම කුසලතා හඳුනා ගැනීම මෙහිදී අපේක්ෂා කෙරේ.

වැදගත් :
පහත දැක්වෙන චර්යා ප්‍රදර්ශනය කරන දරුවන් පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතු අතර, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවශ්‍ය මැදිහත්වීම් කළ යුතු ය.
1. තනි ව ශරීර කෘත්‍යය සිදු කළ නොහැකි දරුවන්
2. තනි ව ආහාර ගත නොහැකි දරුවන්
3. හිස කෙස්, නිය හා ඇඳුම් අපිරිසිදු දරුවන්

| නිරීක්ෂණ වාර්තා කර ගැනීම<br><br>√ සතුටුදායකයි<br>● සංවර්ධනය විය යුතුයි | | | දරුවාගේ නම | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රත්‍යක්ෂ කුසලතා | වර්ණ සහ රටා හඳුනා ගැනීම | පළමුවැනි රටාවට ගැළපෙන ඊළඟ රූපය නිවැරදි ව තෝරයි. | | | | | |
| | | පළමුවැනි රටාව නිවැරදි ව සම්පූර්ණ කරයි. | | | | | |
| | | දෙවැනි රටාවට ගැළපෙන ඊළඟ රූපය නිවැරදි ව තෝරයි. | | | | | |
| | | දෙවැනි රටාව නිවැරදි ව සම්පූර්ණ කරයි. | | | | | |
| | | වර්ණ නිවැරදි ව හඳුනා ගනියි. | | | | | |
| | කොටස් ගැලපීම | කොටස් දෙකකට කැපූ රූපය සම්පූර්ණ කරයි. | | | | | |
| | | කොටස් දෙකකට කැපූ රූපය නිවැරදි ව එක් රූපයක් ලෙස සම්පූර්ණ කරයි. | | | | | |
| දළ හා සියුම් චාලක කුසලතා | මල් හැදීම | කොළයේ දිග අතට තීරුවක් නවයි. | | | | | |
| | | කොළය හරස් අතට තබා ගෙන කුඩා තීරුවලට ඉරයි. | | | | | |
| | | කුඩා තීරු ලෙස ඉරන ලද කඩදාසිය එකතු කර මලක් සාදයි. | | | | | |
| | කොළ ගුලි කරමු ඇලවමු | කඩදාසියක් සියුම් කැබලිවලට ඉරයි. | | | | | |
| | | ඉරූ කඩදාසි කැබලි බෝල ලෙස ගුළි කරයි. | | | | | |
| | | සපයන ලද හැඩයෙහි දාර දිගේ ගුළිකළ බෝල අලවයි. | | | | | |
| | | රූපයේ නිමාව ගැන සැලකිලිමත් වෙයි. | | | | | |
| | කපා අලවමු | දී ඇති සීමාව තුළ පාට කරයි. | | | | | |
| | | කතුර නිවැරදි ව අල්ලයි. | | | | | |
| | | දී ඇති සීමාව දිගේ කපයි. | | | | | |
| | | කැපූ හැඩ තවත් කඩදාසියක අලවයි. | | | | | |
| | දුවමු-පනිමු-නගිමු | කෙටි දුරක් දුවයි. (මීටර් දහයක් පමණ). | | | | | |
| | | දෙපා එක තැනෙක තබා ගෙන කෙටි දුරක් ඉදිරියට පනියි. | | | | | |
| | | නැගුම් රාමුවේ නැග පහළට බසියි. | | | | | |
| | | සමබර දණ්ඩ මත එක් කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා ගමන් කරයි. | | | | | |
| | | සහයෝගයෙන් සෙල්ලම් මිදුලෙහි උපකරණ පරිහරණය කරයි. | | | | | |
| | | සෙල්ලම් මිදුලෙහි උපකරණ භාවිත කිරීමේ දී තමන්ගේ වාරය එන තුරු සිටියි. | | | | | |
| | | ආරක්ෂාකාරී ලෙස සෙල්ලම් මිදුලෙහි උපකරණ පරිහරණය කරයි. | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සමාජ කුසලතා | සෙල්ලම් ගෙදර සෙල්ලම් කරමු | අන් සිසුන් සමඟ සුහද කතාබහේ යෙදෙයි. | | | | | |
| | | අන් සිසුන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කරයි. | | | | | |
| | | අන් සිසුන්ට කැමැත්තෙන් උදවු ලබා දෙයි. | | | | | |
| | | අන් සිසුන් සමඟ ද්‍රව්‍ය හුවමාරු කර ගනියි. | | | | | |
| යහ පුරුදු හා ඉගෙනීමට නැඹුරු වූ කුසලතා | ඉගෙනීමට නැඹුරු වූ කුසලතා | පුරුද්දක් වශයෙන් ආහාර ගැනීමට පෙර හා පසු සබන් දමා නිවැරදි ව අත් සෝදයි. | | | | | |
| | | අනෙක් අයගේ උදවු නොමැතිව ආහාර ගනියි. | | | | | |
| | | අනුභව කිරීමේදී ආහාර සහ වතුර නොවිසුරුවයි. | | | | | |
| | | පිරිසිදුකම පවත්වා ගනියි. (මුහුණ, හිස, නිය, දෙපා). | | | | | |
| | | ඇඳුම්වල පිරිසිදුකම පවත්වා ගනියි. | | | | | |
| | | ආචාරශීලී හැසිරීම් ප්‍රදර්ශනය කරයි. (Good Morning, ආයුබෝවන් ස්තුතියි වැනි). | | | | | |
| | | තමාගේ අතපසුවීම්වලට සමාව ඉල්ලයි. | | | | | |
| | සුව පැවැත්ම සඳහා යහ පුරුදු | ක්‍රියාකාරකම්වලදී පරිහරණය කරන දේවල් පිළිවෙළකට තබයි. | | | | | |
| | | ආරම්භ කරන ලද ක්‍රියාකාරකමක් නිමාවක් දක්වා සිදු කරයි. | | | | | |
| | | උනන්දුවෙන් හා අවධානයෙන් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වෙයි. | | | | | |
| | | ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ප්‍රීතිමත් හැසිරීම් ප්‍රදර්ශනය කරයි. | | | | | |
| නිර්මාණාත්මක කුසලතා | සුරතල් වෙමු | පන්තිය ඉදිරියේ තනි ව තමා කැමති ඉදිරිපත් කිරීමක් කරයි. (ගීතයක්/කවියක්) | | | | | |
| | | අනෙකුත් සිසුන් සමඟ ගායනයෙහි යෙදෙයි. | | | | | |
| භාෂා කුසලතා | සිද්ධියක්/කථාවක් ගොතමු | දෙන ලද පින්තූර කාඩ්පතෙහි ඇති රූප  හතරක් නම් කරයි. | | | | | |
| | | රූප ඇසුරින් ගැළපෙන කතාවක් ඉදිරිපත් කරයි. | | | | | |
| | | කතාවේ කැමති අවස්ථාවක් චිත්‍රයකින් ඉදිරිපත් කරයි. | | | | | |

**සිසුවාගේ පසුබිම් තොරතුරු** (අනවශ්‍ය කොටස් කපා හරින්න)

එක් දරුවෙකු සඳහා එක් පෝරමයක් සම්පූර්ණ කරන්න.

1. සිසුවාගේ නම : ..........................................................................................................................
2. 01.01.2026 දිනට වයස : අවු ..................... මාස ......................... දින ............................
3. ගැහැනු/පිරිමි බව : ..........................................................................................................................
4. ජාතිය : සිංහල/දෙමළ/මුස්ලිම්/වෙනත්
5. ආගම :
6. (අ) සිසුවා පෙර පාසල් අධ්‍යාපනය ලබා තිබේ ද? ඔව්/නැත
   (ආ) පෙර පාසල් අධ්‍යාපනය ලැබූ අවුරුදු ගණන කීය ද? 01/02
7. සිසුවාගේ වර්ධනය :
   (අ) සෞඛ්‍ය සම්පන්න බව - හොඳයි/මධ්‍යස්ථයි/දුර්වලයි
   (ආ) ක්‍රියාකාරී බව - හොඳයි/මධ්‍යස්ථයි/දුර්වලයි
   (ඇ) උස - සෙ.මී
   (ඈ) බර - කි.ග්රෑම්

**8. සිසුවාගේ පවුලේ පසුබිම පිළිබඳ තොරතුරු**

(අ) සිසුවා ජීවත් වන්නේ දෙමාපියන්/මව/පියා/භාරකරුවකු සමගය
(ආ) පවුලට ස්ථාවර ආදායමක් ඇත/නැත
(ඇ) පවුලට ජීවත් වීමට නිවසක් ඇත/නැත
(ඈ) පවුලට ඇතුළත් වන සාමාජිකයන් ගණන -
(ඉ) මවගේ අධ්‍යාපන මට්ටම -
(ඊ) පියාගේ අධ්‍යාපන මට්ටම -

9. (අ) පියාගේ /මවගේ/ භාරකරුගේ නම :
   (ආ) නිවසේ ලිපිනය :
   (ඇ) දුරකථන අංකය :

ගුරුවරයාගේ නම : ..........................................................................................................................
අත්සන : ..........................................................................................................................

ඇමුණුම 01

## දරුවා හඳුනා ගැනීමේ වැඩසටහන සඳහා පාසලේ සූදානම

**පාසලේ සූදානම : විදුහල්පති තුමාගේ අවධානය සඳහා**

| සූදානමට අදාළ අංශ | ඔව් | නැත | වැඩිදුර දියුණු විම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු ය |
|---|---|---|---|
| 1. පන්ති කාමර අනෙකුත් පන්ති කාමරවලින් වෙන් කොට ඇත. | | | |
| 2. පළමුවැනි ශ්‍රේණියේ සිසුන්ගේ ආරක්ෂාව තහවුරු කොට ඇත. | | | |
| 3. පළමුවැනි ශ්‍රේණියේ පන්ති කාමර පරිසරය සිසුන්ට ප්‍රිය ජනක ලෙස සකස් කර ඇත. | | | |
| 4. පළමුවැනි ශ්‍රේණියේ පන්ති කාමරවලට සිසුන්ට පහසුවෙන් ළඟාවිය හැකි ය. | | | |
| 5. පාසල තුළ බීමට ජලය ඇත. | | | |
| 6. සිසුන්ට ගැළපෙන ප්‍රමාණවත් ජල පහසුකම් සහිත වැසිකිළි ඇත. | | | |
| 7. පන්ති කාමරවලින් කුණු ඉවත් කිරීමට යෝග්‍ය වැඩ පිළිවෙළක් ඇත. | | | |
| 8. සිසුන් සඳහා නිසි පෝෂණ වැඩ සටහනක් ක්‍රියාත්මක වේ. | | | |
| 9. පළමුවැනි ශ්‍රේණිවල ඉගැන්වීම සඳහා පළපුරුදු හා පුහුණු ගුරුවරුන් පත්කර ඇත. | | | |
| 10. පළමුවැනි ශ්‍රේණි සඳහා නම්‍ය කාලසටහනක් ක්‍රියාත්මක වෙයි. | | | |
| 11. පළමුවැනි ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක දෙමව්පිය කව පිහිටුවා ඇත. | | | |
| 12. පළමුවැනි ශ්‍රේණියේ දරුවන්ගේ දෙමව්පියන් සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රමයක් සකසා ඇත. | | | |

විදුහල්පතිගේ අත්සන : ......................................... දිනය : ................................................

## ii කොටසඃ පන්ති කාමර සූදානමඃ ගුරුවරයාගේ අවධානය සඳහා

| සූදානමට අදාළ අංශ | ඔව් | නැත | වැඩිදුර දියුණු වීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය |
|---|---|---|---|
| 1. වාතාශ්‍රය හා ආලෝකය සතුටුදායක මට්ටමක පවතී | | | |
| 2. පුටු හා මේස දරුවන්ට ප්‍රමාණවත් වන අතර වයසට ගැළපේ. | | | |
| 4. සෑම දරුවෙකුට ම ප්‍රමාණවත් ඉඩක් පන්ති කාමරය තුළ ඇත. | | | |
| 5. ක්‍රියාකාරී ඉගෙනුම් අද්දැකීම් ලැබීම සඳහා උචිත ඉගෙනුම් පරිසරයක් ඇත. උදාඃ වැලි ආශ්‍රිත ක්‍රියාකාරකම් කිරීමට ස්ථානයක්, පොත් කියවීමට ස්ථානයක්, දරුවන්ගේ නිර්මාණ ප්‍රදර්ශනයට තැනක්, වැඩ මේස වැනි.... | | | |
| 6. ප්‍රමාණවත් හා වයසට ගැළපෙන උපකරණ ඇත. | | | |
| 7. වයසට ගැළපෙන ආරක්ෂාකාරී සුදුසු උපකරණ සහිත සෙල්ලම් මිදුලක් ඇත. | | | |
| 8. ඉගෙනුම් ද්‍රව්‍ය ඇසිරීමට අවශ්‍ය පහසුකම් ඇත. | | | |
| 9. ක්‍රියාකාරී ඉගෙනුම් වාතාවරණයකට යෝග්‍ය අභ්‍යන්තර හා එළිමහන් පරිසරයක් ඇත. | | | |

## දරුවා හඳුනා ගැනීමෙන් පසු

දරුවන් හඳුනා ගැනීමට අදාළ තක්සේරු නිර්ණායකවලට අනුව ඔබේ නිරීක්ෂණ මත එක් එක් දරුවන් සම්බන්ධයෙන් තිත් සලකුණු හෝ හරි සලකුණු යොදා ඇත. යම් යම් නිර්ණායක සඳහා තිත් සලකුණු සහිත දරුවන් කෙරෙහි විශේෂ අවධානයක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ඔබ විසින් යොමු කළ යුතුයි. යම් යම් තක්සේරු නිර්ණායක සඳහා දුෂ්කරතා පෙන්වූ දරුවන් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සුදුසු පරිදි අවස්ථා සැපයීමට ඔබට හැකියාව ඇත.

නිදසුන 1

**චාලක කුසලතා සම්බන්ධයෙන් උදව් අවශ්‍යය දරුවන්:**

සමබර දණ්ඩ මත ඇවිදීමේදී තිත් සලකුණු යෙදූ දරුවන්ට (√) සලකුණු යෙදූ දරුවන්ගේ ක්‍රියාකාරීත්වය නිරීක්ෂණයට අවස්ථාව ලබාදී (●) සලකුණු ලැබූ දරුවන් දිරි ගන්වමින් ඔවුන්ගේ කුසලතා සංවර්ධනයට විවිධ උපාය මාර්ග යෙදීම හා පෙලඹවීම.

සමබරතාවයෙන් කටයුතු කිරීම සඳහා උදවු අවශ්‍ය සිසුන් මෙන් ම සමබර දණ්ඩ මත යාමේදී අපහසුතා ඇති සිසුන්ට **සෙල්ලම් මිදුල** යටතේ හඳුන්වා ඇති ක්‍රියාකාරකම්වලට අමතරව බෝංචි මල්ල ආශ්‍රිත ව පහතින් දක්වා ඇති ක්‍රියාකාරකම්ද ඔවුන්ට උදවු කිරීම සඳහා යොදාගත හැකි ය.

1. බෝංචි මල්ල හිස මත තබා ගෙන ටික දුරක් ඇවිදින්නට උපදෙස් දෙන්න.
2. ඉදිරියට හා ආපස්සට ඇවිදීම, ඉක්මනින් ඇවිදීම ආදී වශයෙන් ඉරියවු වෙනස් කරමින් බෝංචි මල්ල හිස මත තබා ගෙන ඇවිදින්නට උපදෙස් දෙන්න.
3. බෝංචි මල්ල හිස මත තබා රිද්මානුකූල චලනවල යොදවන්න.

4. පළල වැඩි හා උස අඩු ලෑල්ලක් මත බෝංචි මල්ල හිස මත තබා ගෙන තව කෙනෙකුගේ උදවු ඇති ව ඇවිදින්නට උපදෙස් දෙන්න.
5. "සයිමන් කියනවා අලියා වගේ යන්න, සයිමන් කියනවා අත් ඔසවන්න . . ." ආදි වශයෙන් ක්‍රියාවල යොදවන්න.

**නිදසුන 2**

**චාලක කුසලතා**

සමබර දණ්ඩ දිගේ එක් කෙළවරක සිට අනෙක් කෙළවරට ගමන් කරයි.
උක්ත නිර්ණායකයට හරි සලකුණු යෙදූ දරුවන් නිරීක්ෂණය කරමින් අදාළ ක්‍රියාකරකමේ යෙදීමට තිත් සලකුණු සහිත වූ දරුවන් උනන්දු කිරීම

**නිදසුන 3**

**සමාජ කුසලතා**
අන් සිසුන් සමග සුහද කතා බහේ යෙදෙයි.
යන නිර්ණායකයට තිත් සලකුණු ලැබූ සහ හරි සලකුණ ලැබූ සිසුන් දෙදෙනා බැගින් සිව් දෙනාගේ කණ්ඩායම් වශයෙන් කණ්ඩායම් අසුන් ගත කිරීමෙන්, තිත් සලකුණු යෙදූ දරුවන්ගේ සමාජ කුසලතා සංවර්ධනය

**නිදසුන 4**
**ප්‍රජානන කුසලතා**
නිර්ණායකය. දෙවැනි රටාවට ගැළපෙන ඊළඟ රූපය නිවැරදිව තෝරයි.
උක්ත නිර්ණායක හරි සලකුණු යෙදූ දරුවෙකු හා තිස් සලකුණු ය. දූදරුවන් යුගල වශයෙන් කොටස් ගැළපීමේ හා රටා හඳුනා ගැනීමේ ක්‍රියාකාරකම්වල යෙදීමට සැලැස්වීම

**නිදසුන 5**
**භාෂා කුසලතා**
අනෙකුත් සිසුන් සමග ගායනයේ යෙදී යන නිර්ණායකය හරි සලකුණු යෙදූ සිසුන් කිහිප දෙනෙකු සහ තිත් සලකුණු යෙදූ සිසුන් කිහිපදෙනෙකු එක්කර පන්තියේ ගායනා කිරීමේ ක්‍රියාකාරකම් සඳහා අවස්ථා සැලසීම

මෙසේ නිර්මාණශීලි ලෙස සහ අවබෝධයෙන් යුතු ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ අවස්ථා සම්පාදනය කිරීමෙන් සිසුන්ගේ සමස්ත සංවර්ධනයට උදව්වක් වනවා මෙන් ම ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය වඩාත් පහසු හා ප්‍රියජනක කාර්යයක් වනු ඇත.

## සෙල්ලම් මිදුල

පළමුවන ශ්‍රේණියට පිවිසෙන දරුවන්ගේ සමබර සංවර්ධනයක් සඳහා බුද්ධිමය මෙන් ම ශාරීරික,

**විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනා ගත්තේ නම් ඔබ කළ යුතු දේ**

දරුවා හඳුනා ගැනීම හා සම්බන්ධ සෙල්ලම්වලදී විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ඔබට හමුවිය හැකිය . එවැනි දරුවන්ගේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා ඔබට පහත සඳහන් ආකාරයේ නිරීක්ෂණ පත්‍රිකාවක් යොදා ගත හැකි ය.

## ආදර්ශන නිරීක්ෂණ පත්‍රිකාව

*සැ.යු.* මෙහි ඇති සංක්ෂිප්ත තොරතුරු ඇසුරින් වඩා සවිස්තර නිරීක්ෂණ පත්‍රිකාවක් සකස් කර ගන්න. ඔබ විසින් හඳුනා ගනු ලබන තොරතුරු සඳහන් කළ යුත්තේ එම පත්‍රිකාවේ බව සලකන්න. මෙය හුදෙක් ඔබට කරන මඟ පෙන්වීමක් මිස සම්පූර්ණ තොරතුරු පත්‍රිකාවක් නොවේ.

### A මූලික තොරතුරු

දරුවාගේ නම : ............................................

ස්ත්‍රී/පුරුෂ බව : ............................................

පාසලේ නම හා ලිපිනය : ............................................

............................................

නිරීක්ෂණය කළ පන්තිය : ............................................

පන්ති භාර ගුරුවරයාගේ නම : ............................................

නිරීක්ෂණය කළ දිනය හා වේලාව : ............................................

### B නිරීක්ෂණ තොරතුරු

දරුවා පිළිබඳ පසුබිම් තොරතුරු : ............................................

දරුවාගේ හැසිරීම පිළිබඳ : ............................................

චාලක හැකියාවන් : ............................................

උපකරණ භාවිතය : ............................................

අමුතු හැසිරීම් : ............................................

සමාජ සම්බන්ධතා : ............................................

අන් අයට දක්වන ප්‍රතිචාර : ............................................

භාෂා හැකියා : ............................................

දෘෂ්ටි සංජානනය : ............................................

ශ්‍රවණ සංජානනය : ............................................

සහජ කුසලතා : ............................................

වෙනත් තොරතුරු : ............................................

**C වෛද්‍ය වාර්තාවලින් ලබා ගත් තොරතුරු**

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

**D අසා දැන ගත් තොරතුරු**

1. ගුරුතුමිය සඳහන් කළ තොරතුරු : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
2. පොත් පත් වැඩ පැවරුම් ආදියෙන් ලබා ගත් තොරතුරු : . . . . . . . . . . . . . . . . . . . . . . .
3. දෙමාපියන්ගෙන් ලබා ගත් තොරතුරු (ඇතොත්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
4. වෙනත් : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

**E සාරාංශය**

(ඉහත තොරතුරු හා ඔබේ හැඟීම් ද ඇතුළත් කොට දරුවා පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් සකස් කරන්න.)

**F ඔබගේ නිර්දේශ**

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
3. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
4. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

නිරීක්ෂණය කළ අයගේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

නිරීක්ෂණය කළ අයගේ අත්සන : . . . . . . . . . . . . . . . . . . . .

නිරීක්ෂණය කළ දිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

**මෙම වැඩසටහනේදී ඔබ යම් විශේෂ අවශ්‍යතා සහිත දරුවකු හඳුනා ගනු ලැබුවහොත් එම දරුවා කළාප අධ්‍යාපන කාර්යාලයේ ස්ථාපනය කර ඇති විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව වෙත, දෙමාපියන්ගේ දැනුවත් බව සහිත ව යොමු කිරීමට අවශ්‍ය ඉදිරි පියවර සම්පාදනය කරන්න.**

චිත්තවේගීය හා සමාජයීය සංවර්ධනය අත්‍යවශ්‍ය වේ. සැලසුම්ගත වින්දනාත්මක පරිසරයක ක්‍රියාශීලි ලෙස හැසිරීමට හැකි ඉගෙනුම් අවස්ථා සිසුන්ට තිබිය යුතුය. පන්තියේ සියලු ම සිසුන්ට වින්දනාත්මක ක්‍රියාශීලී අවස්ථා ලබා දෙන ස්ථානයක් ලෙස සෙල්ලම් මිදුල හඳුන්වා දිය හැකි ය. එහෙයින් සෙල්ලම් මිදුල, එළිමහන් ඉගෙනුම් පරිසරයේ ඇති වැදගත් ම ස්ථානයකි.

සිසුන්ගේ ඕනෑ එපාකම් කැමති අකමැතිකම් හැකි නොහැකිකම් අනුව ක්‍රියාකාරකම් තෝරා ගැනීමට සෙල්ලම් මිදුලකට

- රිංගීමට
- පැද්දීමට
- නැගීමට
- එල්ලීමට
- විසි කිරීමට

අවස්ථා තිබිය යුතුය. එමෙන් ම ප්‍රදේශයට ආවේණික ද්‍රව්‍ය ආශ්‍රයෙන් සකසා ගත් ආරක්ෂාකාරී උපකරණ ද සිසුන්ගේ හැකියා මට්ටම්වලට ගැළපෙන උපකරණ ද මෙයට එක් කර ගත හැකිය.
සෙල්ලම් මිදුලේදී සිසුන් නිරත වන ක්‍රියාකාරකම්,

- රිංගීම, පෙරළීම, දිවීම, පැනීම, එල්ලීම වැනි චාලක හැකියා සංවර්ධනය කර ගැනීමට
- සමායෝජනය, සමබරතාවය, රිද්මය, නම්‍යතාවය හා නිවැරදි ඉරියවු පවත්වා ගැනීම දියුණු කර ගැනීමට
- සිසුන්ගේ හසුරු කුසලතා සංවර්ධනයට
- සහයෝගය, සාමූහිකව කටයුතු කිරීම, බෙදා හදා ගැනීම, ඉවසීම, එකිනෙකාට උපකාර කිරීම වැනි යහපත් ගුණාංග සංවර්ධනයට
- එක් ව සතුටු වීමට හා චිත්තවේගීය සමබරතාව පවත්වා ගැනීමට යොදා ගත හැකි ය.


එසේම ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාව තුළ විවිධ විෂය සංකල්ප තහවුරු කිරීම සඳහා ද සෙල්ලම් මිදුලේ උපකරණ යොදා ගත හැකි ය.
උදා:

**ගණිතය විෂය ක්ෂේත්‍රය සඳහා** -
උඩ, යට, දුර, ළඟ, පහළ, ඉහළ, සෙමෙන්, වේගයෙන්, ලොකු, කුඩා, පටිපාටි ගත කිරීම, ගණන් කිරීම වැනි මූලික ගණිත සංකල්ප පිළිබඳ මූලික කුසලතා සංවර්ධනයට

**භාෂාව විෂය ක්ෂේත්‍රය සඳහා** -
වමේ සිට දකුණට ඇස ගමන් කිරීමට
වාමාවෘත්ත ව හා දක්ෂිණාවෘත ව ශරීරය හැසිරවීමට
ඔන්චිලි වාරම් වැනි කවි, ගී භාවිතයට

**පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය ක්ෂේත්‍රය සඳහා** -
සමාජ කුසලතා සංවර්ධනයට
උදා: එක් ව කටයුතු, බෙදා හදා ගැනීමට, තම වාරය එනතුරු ඉවසීමට


## සෙල්ලම් මිදුලෙහි යොදා ගන්නා උපකරණ කිහිපයක් සඳහා නිදසුන්



කොටසක් පොළවට යට කරන ලද ටයර්




නැගුම් රාමුව



සමබර දණ්ඩ



පොල්කටු නැගුම් වැල



වැල් ඉණිමඟ